ප්‍රධාන ප්‍රති මිල දී ගැනීම් ගිවිසුම (Master Repurchase Agreement)

මෙම ගිවිසුම ශ්‍රී ලංකාවේ සමාගමක් ලෙස සංස්ථාපිත (ලියාපදිංචි අංක පී.බී.795) බලයලත් ප්‍රාථමික ගැනුම්කරුවෙකු ලෙස අංක : 400, ගාලු පාර, කොළඹ 03 දරන ස්ථානයේ ලියාපදිංචි ලිපිනය සහිත එන් එස් බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ් (මින් ඉදිරියට "තැරැව්කරු" ලෙස හඳුන්වන සහ අනුප්‍රාප්තිකයන් සහ පැවරුම්කරුවන් ඇතුලත්ව) සහ (ජා.හැ.අංක / ලියාපදිංචි අංක)..දරන .... පදිංචි (මින් ඉදිරියට "ගණුදෙනුකරු" ලෙස හඳුන්වන සහ අනුප්‍රාප්තිකයන් සහ පැවරුම්කරුවන් ඇතුලත්ව) අතර .... දින එළඹෙන ලදි.

(එක් පුද්ගලයෙකු පාර්ශ්වය සහ එක්ව පාර්ශ්වකරුවන්)

1. අර්ථ දැක්වීම

මෙම ගිවිසුමේ අරමුණු උදෙසා, පහත දැක්වෙන නිර්වචනයන් පහත සඳහන් අරුත් දරයි.

"කඩිනම් කිරීමේ දිනය" (Acceleration Date) යනු, ගිවිසුමේ වගන්ති වලට අනුව නිකුත්කළ කෙළවර කිරීමේ නිවේදනයක ප්‍රතිඵලයක් ලෙස සියළු ගණුදෙනුවල ප්‍රතිමිලදී ගැනීම් සිදුවිය යුතු දිනය වේ.

"බුන්වත් බව ක්‍රියාත්මක වීම" (Act of Insolvency) යනු, පාර්ශ්වයකට අදාලව (i) සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී තම ණය ගෙවීමට නොහැකි වූ පාර්ශ්වය (ii) කවර හෝ භාරකරුවෙකු, පරිපාලකයකු හෝ ලබන්නකු හෝ ඇවරකරුවෙකු හෝ සමාන නිළධාරියෙකු පාර්ශ්වය හෝ එහි දේපොලවල කිසියම් භෞතික කොටසක් සඳහා පත් කිරීමට ඉල්ලා සිටින, කැමැත්ත පලකරන හෝ විරුද්ධත්වයක් නොදක්වන පාර්ශ්වයක් හෝ (iii) බංකොලොත්භාවය, වසා දැමීම හෝ පාර්ශ්වයක බුන්වත්බව පිළිබද හෝ වෙනත් ඕනෑම සමාන ක්‍රියාවලියකට එරෙහිව ඕනෑම අධිකරණයක හෝ ඕනෑම ආයතනයක් ඉදිරියේ පෙත්සමක් ඉදිරිපත් කර හෝ ගොනුකර ඇති විට එම ගොනු කළ දිනයේ සිට දින 30 ක් ඇතුළත එය ඉවත් කිරීමට හෝ තහනම් කිරීමට පියවර නොගන්නා යම් පාර්ශ්වයක්.

"ගිවිසුම" (Agreement) යනු, එහි කොටසක් වන සියළු ගණුදෙනු ඇතුලත් ප්‍රධාන ප්‍රතිමිලදීගැනුම් ගිවිසුමයි.

"සංශෝධිත ප්‍රති මිළදීගැනුම් මිල" (Amended Repurchase Price) යනු 7 වැනි වගන්තියට අනුව පැහැදිලි කර ඇති අරුත වේ.

"ව්‍යාපාර දිනය" (Business Day) යනු තැරුව්කරු සාමාන්‍ය ව්‍යාපාර කටයුතු සඳහා විවෘත කර ඇති දිනයකි.

"සී.ඩී.එස්.ගිණුම" (CDS Account) යනු, ගණුදෙනුකරු විසින් රජයේ සුරැකුම්පත් ("Lanka Secure") සඳහා වු මධ්‍යම තැන්පතු ක්‍රමයේ සුදුසුකම් ලබන කොටස් රඳවා ගනිමින් යෝග්‍ය ආකාරයෙන් පවත්වාගෙන යන ගිණුම වේ.

"තහවුරු කිරීම" (Confirmation) යනු, ඇමුණුම 1 හි දක්වා ඇති ආකාරයෙන් තැරැව්කරු විසින් නිකුත් කරන ලද, තහවුරු කිරීමේ ප්‍රකාශයයි.

"පෙරනිමි අනුපාතිකය" (Default Rate) යනු, ශ්‍රී ලංකා අන්තර් බැංකු සාමාන්‍ය පොලී අනුපාතිකය (SLIBOR) සහ වාර්ෂික 2% එකතුවකි.

"සුදුසු සුරැකුම්" (Eligible Security) යනු, තැරැව්කරු විසින් වරින් වර ගණුදෙනුකරු වෙත, දැනුම් දෙනු ලබන, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද බිල්පත් සටහන් හෝ බැඳුම්කර හෝ එමඟින් අනුමත කරන ලද ඕනෑම ආකාරයක සුරැකුමක් මේ කාර්යය සඳහා සුදුසු සුරැකුම් ලෙස ව්‍යවස්ථාපිත කෙරේ.

"සමාන සුරැකුම්පත්" (Equivalent Securities) යනු, මෙහි 6 වැනි වගන්තිය යටතේ මිලදී ගත් සුරැකුම්පත් වලට සමාන, එකම වර්ගයේ නාමික අගයකින් යුත්, ආකාරය සහ ප්‍රමාණයෙන් සමාන ආදේශක සුරැකුම්පත් වේ.

"වට්ටම්" (Haircut) යනු, සුදුසුකම් ලත් සුරැකුම්පත් වලට අදාලව පාර්ශ්වයන් අතර එකඟතාවයෙන් වෙළඳපොළ වටිනාකමට වඩා අඩු මිලකට සුරැකුම්පත් ගණුදෙනුකිරීමයි. (එය තැරැව්කරු සහ ගණුදෙනුකරු අතර යහචේතනාවෙන් ඇති කර ගන්නා එකඟතාවකි.)

"ආදායම" (Income) යනු, මිල දී ගත් සුරැකුම්පත් වලට අදාලව නිකුතු පාර්ශ්වයෙන් සිදු කරන කූපන ගෙවීම්, පොලී, ලාභාංශ සහ අනිකුත් ගෙවීම් (ප්‍රතිපත්තිමය ගෙවීම් හැර)

"LKR" යනු, ශ්‍රී ලංකාවේ වලංගු රුපියල් වේ.

"වෙළඳපොළ අගය" (Market Value) යනු, ඕනෑම සුරැකුම්පත් වර්ගයකට අදාලව ඊට සමාන සුරැකුම්පත් වල වෙළඳපොළ අගය වන අතර, එලෙස පවතින අගයන් නොමැතිවිට තහවුරු කිරීමේදි දක්වා ඇති ක්‍රමවේදයකට අනුව නීර්ණය කරන අගයකි.

"පැහැර හැරීමේ නිවේදනය" (Notice of Default) යනු, පැහැර හැරීමක් සිදු වූ අවස්ථාවක, පැහැර හැරීම සිදු නොකල පාර්ශ්වය විසින් පැහැර හැරීම සිදු කල පාර්ශ්වය

වෙත සිදුකෙරෙන දැනුම් දීමයි. එවැනි නිවේදනයක් මඟින් අදාල කඩිනම් කිරීමේ දිනය සහ අත්හිටුවීමේ ගෙවීම් දිනයද දක්වනු ඇත.

"අවසන් කිරීම දැනුම්දීමේ අවස්ථාව" (Notice of Termination Event) යනු, අවසන් කිරීමේ අවස්ථාවක් උදා වූ විට පැහැර හැරීම සිදුනොකළ පාර්ශ්වය විසින් අනික් පාර්ශ්වය වෙත සිදුකෙරෙන දැනුම් දීම වන අතර අදාල කඩිනම් කිරීමේ දිනය සහ අත්හිටුවීමේ ගෙවීම් දිනයද එහි දක්වනු ඇත.

"මිලදී ගැනීමේ දිනය" (Purchase Date) යනු, අදාල තහවුරු කිරීමෙහි දක්වා ඇති දිනයයි.

"මිලදීගත් මිල" (Purchase price) යනු, අදාල තහවුරු කිරීමෙහි දක්වා ඇති මිල වේ.

"මිලදීගත් සුරකුම්පත්" (Purchased Securities) යනු, අදාල තහවුරු කිරීමෙහි දක්වා ඇති සුරකුම්පත් වන අතර, මෙහි 6 වැනි වගන්තියට අනුකූල සුදුසුකම්ලත් ආදේශක සුරකුම්ද ඊට අයත් වේ.

"ප්‍රතිමිලදී ගැනීමේ දිනය" (Repurchase Date) යනු, අදාල තහවුරු කිරීමෙහි දක්වා ඇති ප්‍රතිමිලදී ගැනීමේ දිනය වේ.

"ප්‍රතිමිලදී ගැනීමේ මිල" (Repurchase price) යනු, අදාල තහවුරු කිරීමෙහි දක්වා ඇති මිල වේ.

"ප්‍රතිගැනුම් ගණුදෙනුව" (Repurchase Transaction) යනු, අදාල තහවුරු කිරීමෙහි සඳහන් මෙහි කොන්දේසි වලට යටත්ව, තැරැව්කරු විසින් සුදුසුකම් ලත් සුරකුම්පත් (මිලදී ගත් සුරකුම්) ගණුදෙනුකරු වෙත, එකඟ වූ මිලකට (මිලදීගත් මිල) එකඟ වූ දිනයකදී (මිල දී ගත්නා දිනය) විකිණීමට එකඟ වීම සහ ඊට සමගාමීව ගණුදෙනුකරු විසින් මිල දී ගත් සුරකුම්, තැරැව්කරු වෙත එකඟ වූ මිලකට (ප්‍රතිගැනුම් මිල) සහ එකඟ වූ දිනයකදී (ප්‍රතිගැනුම් දිනය) අලෙවි කිරීමට එකඟ වීමයි.

"ප්‍රති විකුණුම් ගණුදෙනුව" (Reverse Repurchase Transaction) යනු, අදාල තහවුරු කිරීමෙහි සඳහන් මෙහි කොන්දේසි වලට යටත්ව, ගණුදෙනුකරු විසින් අදාල ප්‍රතිගැනුම් මිලකට සහ අදාල ප්‍රතිගැනුම් දිනයේදී තැරැව්කරු වෙත, මිල දී ගත් සුරකුම් අලෙවි කිරීමට එකඟවීම සහ ඊට සමගාමීව මිලදීගත් සුරකුම්, අදාල ප්‍රතිගැනුම් මිලකට අදාල ප්‍රතිගැනුම් දිනයේදි ගණුදෙනුකරු වෙත, අලෙවි කිරීමට තැරැව්කරු එකඟ වීම වේ.

"ශ්‍රී ලංකා අන්තර් **බැංකු පිරිවැටුම් අනුපාතය" (Sri Lanka Interbank Offered Rate "SLIBO") යනු,** ශ්‍රී ලංකා අන්තර් බැංකු පිරිවැටුම් අනුපාතය වන අතර, අන්තර් බැංකු

ඒක්ෂණ මුදල් වෙළඳපොලේ මාසයක කාලයක් සඳහා, ලබාදෙන එම අනුපාතය අදාල දිනයකදී පෙරවරු 11 ට රොයිටර් පුවරුවේ **"SLIBOR"** ලෙසින් දිස් වේ.

"අත්හිටුවීමේ දැන්වීම" (Termination Notice) යනු, මෙහි 7(iii) වගන්තියෙහි දැක්වෙන පරිදි නිකුත් කරන ලද නිවේදනය වේ.

"අත්හිටුවීමේ ගෙවීම් දිනය" (Termination Payment Date) යනු, අත්හිටුවීමේ /අවසන් කිරීමේ දැන්වීමේ සඳහන් වන පරිදි මෙහි 7 වන වගන්තියට අදාලව (මෙහි කොන්දේසි වලට යටත්ව) අදාල මුදල ගෙවිය යුතු දිනය වේ.

"ගණුදෙනුව" (Transaction) යනු, ප්‍රතිගැනුම් ගණුදෙනුවක් හෝ ප්‍රතිවිකුණුම් ගණුදෙනුවකි.

ඊට අමතරව මෙම ගිවිසුම තුල සන්ධර්භයට අන් අරුතක් අවශ්‍ය නොවන විට :

(a) මෙහි ඇතුලත් උප මාතෘකා, නිර්දේශනය පහසු කිරීම සඳහා පමණක් යොදා ඇති අතර, මෙම ගිවිසුමේ සැකසුම සඳහා බලපෑමක් ඇති නොකරයි.

(b) අංශ වෙත යොමු කිරීම්, මෙම ගිවිසුමෙහි කොටස් වෙත යොමු කිරීමක් ලෙස, අර්ථ දැක්විය යුතු වේ.

(c) තනි අරුතින් යොදා ගන්නා වචන බහුකාර්ය හා ප්‍රතිවිරුද්ධ ආකාරයෙන්ද, පුරුෂ ලිංග අර්ථයෙන් යොදාගන්නා වචන ස්ත්‍රී ලිංගය සහ ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයටම අදාල වන ආකාරයෙන් සහ,

(d) ව්‍යවස්ථාවකට හෝ අනුබද්ධ ව්‍යවස්ථාවකට සිදුකරන යොමු කිරීමක් කලින් කලට සංශෝධිත, ප්‍රතිස්ථාපිත හෝ ආදේශන ඇතුලත් කල ව්‍යවස්ථාවකට හෝ අනුබද්ධ ව්‍යවස්ථාවකට යොමු කිරීමක් සේ සැලකේ.

2. <u>ප්‍රතිමිලදී ගැනීම් ගණුදෙනු</u>

i. පාර්ශ්වයන් ගණුදෙනුවකට එළඹෙන විට තැරැව්කරු විසින් එම එක් එක් ගණුදෙනුව සඳහා කොන්දේසි තහවුරු කිරීමේ ලිපියක් නිකුත් කල යුතුය.

ii. පාර්ශ්වයන් අතර එළඹෙන ඕනෑම ගණුදෙනුවක්, (ප්‍රකාශිත එකඟතාකට පැමිණ විට හැර) මෙම ප්‍රධාන ප්‍රතිමිල දී ගැනීම් ගිවිසුම මගින් පාලනය වන, ඊට විෂය වන එහි කොටසක් වන අතර, එක් එක් ගණුදෙනු වලට අදාල සියළු තහවුරු කිරීම් සහ මෙම ප්‍රධාන ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම එක් තනි ගිවිසුමක් ලෙස පිහිටුවිය යුතුය.

iii. 7 වන වගන්තියට අදාලව ,

(a) එක් එක් ප්‍රතිමිලදී ගැනීම් ගණුදෙනුවකට අදාලව

A. මිල දී ගැනීම් දිනයේදී තැරැව්කරු විසින් මිලදී ගැනීමේ මිල ලැබීමට යටත්ව, (ගණුදෙනුකරුට තැරැව්කරුගේ හර ලැබීම් සහිත තැරැව්කරු හා සම්බන්ධ ගණුදෙනුකරුගේ මුදල් ගිණුමක් ඇති විට) ගණුදෙනුකරුගේ සී.ඩී.එස්.ගිණුමට මිලදීගත් සුරැකුම්පත් බැර කිරීම හෝ හුවමාරු කිරීම.

B. ප්‍රතිගැනුම් දිනයේදී තැරැව්කරු විසින් ගණුදෙනුකරුගේ සී.ඩී.එස්.ගිණුමට අදාල මිල දී ගත් සුරැකුම්පත් හරකිරීම හෝ ගණුදෙනුකරුගේ අදාල මිල දී ගත් සුරැකුම්පත් සහිත සී.ඩී.එස් ගිණුමෙන් හුවමාරුවක් ලබාගෙන ප්‍රතිගැනුම් මිලකට ගණුදෙනුකරු විසින් මේ කාර්යය සඳහා විශේෂයෙන් සඳහන් කල ගිණුමකට හෝ ගණුදෙනුකරුගේ මුදල් ගිණුමට බැරකිරීම හෝ ගණුදෙනුකරු එකඟ වූ වෙනත් ආකාරයකින් ගෙවීම සිදුකිරීම.

C. මෙහිදී විශේෂයෙන් එකඟ වී පිළිදන්වන පරිදි සෑම ප්‍රතිගැනුම් ගණුදෙනුවකටම තැරැව්කරු විසින් ගණුදෙනුකරු වෙත මිල දී ගත් සුරැකුම්පත්, මිලදී ගත් දින, මිල දී ගත් මිලට අලෙවි කිරීම සහ තැරැව්කරු විසින් ගණුදෙනුකරුගෙන් මිල දී ගත් සුරැකුම්පත්, ප්‍රතිගැනුම් දිනයේදී ප්‍රතිගැනුම් මිලට ලබා ගැනීමටද ඇතුලත් වේ.එමෙන්ම (සැකයක් වැළැක්වීම සඳහා) එවැනි මිලදී ගත් සුරැකුම්පත් වල සමස්ථ නීත්‍යානුකූල සහ ප්‍රතිලාභ අයිතිය පිළිවෙලින් මිල දී ගත් දිනයේ ගණුදෙනුකරු සහ ප්‍රතිගැනුම් දිනයේදී තැරැව්කරු වෙත තබා ගත යුතුය.

(b) සෑම ප්‍රතිවිකුණුම් ගණුදෙනුවක් සම්බන්ධයෙන් :

A. මිල දී ගැනීමේ දිනයේදී තැරැව්කරු විසින් අදාල මිල දී ගත් සුරැකුම්පත් ගණුදෙනුකරුගේ සී.ඩී.එස්. ගිණුමට හර කිරීම හෝ අදාල සුරැකුම්පත් සහිත සී.ඩී.එස්.ගිණුමෙන් හුවමාරුකොට ගණුදෙනුකරුගේ මුදල් ගිණුමට හෝ අදාල කාර්යය සඳහා නිශ්චිතව සඳහන් කල වෙනත් ගිණුමකට බැරකිරීම හෝ ගණුදෙනුකරු එකඟ වූ වෙනත් ආකාරයකින් ගෙවීම සිදු කිරීම.

B. ප්‍රතිගැනුම් දිනයේදී, ප්‍රතිගැනුම් මිල ගණුදෙනුකරු වෙතින් ලැබීමට යටත්ව (ගණුදෙනුකරුගේ මුදල් ගිණුම හා සම්බන්ධ තැරැව්කරු වෙත හර කිරීම් සිදුකල හැකි ගිණුමක් ඇතිවිට) අදාල මිල දී ගත් සුරැකුම්පත් ගණුදෙනුකරුගේ

සී.ඩී.එස්.ගිණුමට බැර කිරීම හෝ අදාල සුරැකුම්පත් ගණුදෙනුකරුගේ සී.ඩී.එස්.ගිණුමට මාරු කිරීම.

C. මෙහිදී විශේෂයෙන් එකඟ වී පිළිදන්වන පරිදි සෑම ප්‍රතිවිකුණුම් ගණුදෙනුවකටම, ගණුදෙනුකරු විසින් තැරැව්කරු වෙත,මිල දී ගත් සුරැකුම්පත්, මිල දී ගත් දින ,මිල දී ගත් මිලට අලෙවි කිරීම සහ ගණුදෙනුකරු විසින් තැරැව්කරු වෙතින් මිල දී ගත් සුරැකුම්පත්, ප්‍රතිගැනුම් දිනයේදී ප්‍රතිගැනුම් මිලට ලබා ගැනීමද ඇතුලත් වේ. එමෙන්ම (සැකයක් වැළැක්වීම සඳහා) මිල දී ගත් සුරැකුම්පත් වල සමස්ථ නීත්‍යානුකූල සහ ප්‍රතිලාභ අයිතිය පිළිවෙලින් මිල දී ගත් දිනයේ තැරැව්කරු වෙත සහ ප්‍රතිගැනුම් දිනයේදී ගණුදෙනුකරු වෙත තබා ගත යුතුය.

iv. තහවුරු කිරීම මඟින් වෙනත් ප්‍රතිපාදනයක් සලසන අවස්ථාව හැර, ප්‍රතිගැනුම් ගණුදෙනුවකදී ගණුදෙනුකරුට හෝ ප්‍රතිවිකුණුම් ගණුදෙනුවකදී තැරැව්කරුට, ගැනුම් දිනයේ සිට ප්‍රතිගැනුම් දිනය දක්වා මිල දී ගත් සුරැකුම්පත් ප්‍රතිස්ථාපනය කිරීමට හෝ ඉවත් කිරීමට හිමිකමක් නොලැබේ.

3. <u>ආදායම</u>

මිල දී ගත් සුරැකුම්පත් වලට අදාලව නිකුතුව සිදු කල පාර්ශ්වයෙන් කිසියම් ආදායම් ගෙවීමක් (“Income Payment”) සිදු කළේ නම්,

i. එය මිලදී ගැනුම් දිනයට පසු, ප්‍රතිගැනුම් දින හෝ ඊට පෙර දිනකදී එළඹෙන ප්‍රතිගැනුම් ගණුදෙනුවකට අදාල ගෙවීමක් නම්,එම ප්‍රතිලාභය තැරැව්කරුට හිමිවිය යුතු අතර, (සැකයකින් තොරව) තැරැව්කරු එහි හිමිකරු බැවින්, එවැනි ආදායම් ගෙවීමක් ගණුදෙනුකරු වෙත සිදු කළේ නම්, එම ව්‍යාපාර දිනයේදීම ඊට සමාන මුදලක් ගණුදෙනුකරු විසින් තැරැව්කරු වෙත ගෙවිය යුතු අතර,

ii. මිල දී ගැනීමේ දිනයෙන් පසු, ප්‍රතිගැනුම් දින හෝ ඊට පෙර එළඹෙන ප්‍රතිවිකුණුම් ගණුදෙනුවකට අදාල ආදායම් ගෙවීමක් නම්, එම ප්‍රතිලාභය ගණුදෙනුකරු වෙත හිමිවිය යුතු අතර, එවැනි ගෙවීමක් තැරැව්කරු වෙත සිදු කරනු ලැබුවහොත් එම ව්‍යාපාර දිනයේදීම තැරැව්කරු විසින් ගණුදෙනුකරු වෙත ඊට සමාන මුදලක් ගෙවිය යුතුය.

4. <u>නියෝජනය</u>

4.1. ගණුදෙනුකරු පහත දැක්වෙන ආකාරයෙන් තැරැව්කරු නියෝජනය කරයි. (ගණුදෙනුකරු ගණුදෙනුවකට එළඹෙන සෑම දිනකදීම එම නියෝජනය නැවත සිදු වේ).

i. මෙම ගිවිසුම සකස් වී ඇති නියමයන් සහ කොන්දේසි වලට යටත්ව අදාල තහවුරු කිරීම් යටතේ ගිවිසුමේ වගකීම් ඉටු කරලීම සඳහා අවශ්‍ය සියළු අනුමැතීන් සහ එකඟතාවන් ලබා ඇති බැවින් ඒ සඳහා ගණුදෙනුකරුට පූර්ණ බලතල හිමි වේ.

ii. ගණුදෙනුකරු මෙම ගිවිසුමට එළඹෙන අතර, මේ යටතේ එම ගණුදෙනු ප්‍රධාන වේ.

iii. මෙම ගිවිසුමේ ඕනෑම ගණුදෙනුවක් යටතේ ගණුදෙනුකරු විසින් ගෙවන ලද සියලු මුදල්වල එකම ප්‍රතිලාභ හිමිකරු ගණුදෙනුකරුවේ.

iv. ගණුදෙනුකරු පූර්ණ ලෙස දැනුවත් කර ඇති අතර, මෙම ගිවිසුමට එළඹීමෙන් පැන නඟින බදු සහ ගිණුම්කරණ ප්‍රතිඵල සහ අනාගත මූල්‍ය ප්‍රතිලාභ සහ අවදානම් මෙන්ම, ගණුදෙනුකරුගේ මූල්‍යමය අවශ්‍යතාවන්ට පවතින උපයෝගීතාව පිළිබඳ ඇඟයීමට ගණුදෙනුකරු දැනුමකින් සහ පළපුරුද්දකින් යුක්ත වේ. (ගණුදෙනුකරුගේ ස්වීය විනිශ්චයන් සහ තැරැව්කරු හැර වෙනත් පාර්ශ්වයකින් ස්වාධීනව ලබාගත් වෘත්තීය උපදේශ මත පදනම්ව).

v. ගණුදෙනුකරු මෙම ගිවිසුම සහ සිය ගණුදෙනු සම්බන්ධයෙන් තැරැව්කරුගේ අදහස් හෝ උපදේශය මත පමණක් රඳා නොපවතින අතර ස්වීය ඇඟයීම් මත (ගණුදෙනුකරු සිය අවශ්‍යතාව මත ලබාගන්නා වෘත්තීමය උපදේශ ඇතුළුව) සෑම ගණුදෙනුවක් සඳහාම එළඹීමට තීරණය කරන අතර, සහ

vi. මේ යටතේ ගණුදෙනු පාර්ශ්වයක් වීම පිළිබඳ ගණුදෙනුකරු සෑහීමකට පත්ව ඇති අතර, එහි බදු ප්‍රතිඵල ඇගයීම පිළිබඳ වගකීම අඛණ්ඩව දරනු ඇත.

4.2. තැරැව්කරු පහත දැක්වෙන ආකාරයෙන් ගණුදෙනුකරු නියෝජනය කරයි. (තැරැව්කරු ගණුදෙනුවකට එළඹෙන සෑම දිනකදීම එම නියෝජනය නැවත නැවතත් සිදු වේ).

i. මෙම ගිවිසුම සකස් වී ඇති නියමයන් සහ කොන්දේසි වලට යටත්ව අදාල තහවුරු කිරීම් යටතේ ගිවිසුමේ වගකීම් ඉටුකරලීම සඳහා අවශ්‍ය සියළු අනුමැතීන් සහ

එකඟතාවන් ලබා ඇති බැවින් ඒ සඳහා තැරැව්කරුට පූර්ණ බලතල හිමි වේ.

ii. තැරැව්කරු විසින් ගණුදෙනුකරු එළඹෙන ගණුදෙනු මඟින්, අදාල ගණුදෙනු වලට බලපවත්වන කිසිදු විචක්ෂණශීලී නියමයන් හෝ රෙගුලාසියක් උල්ලංඝණය නොවේ.

5. <u>බදු</u>

බදු රඳවා ගැනීම හෝ අඩුකරගැනීම නීතියෙන් අවශ්‍ය වූ විට හෝ බදු අධිකාරියක ක්‍රියාමාර්ගයක් වූ විට හැර, වෙනත් ආකාරයකින් එකඟ වූ විට මිස, මේ යටතේ සිදුකෙරෙන ඕනෑම ගණුදෙනුවකට අදාල සියළු ගෙවීම් නිදහස් සහ පැහැදිලි ලෙස සිදු කල යුතු අතර, කවර ආකාරයකින් හෝ පනවන ලද, කිසිදු බද්දක් අයකරගැනීමට, එක්රැස් කිරීමකට, රඳවා ගැනීමට හෝ බදු සඳහා ඇඟයීමට කිසිදු අධිකාරියකට බලයක් නොමැත. එලෙස බදු අඩුකරගත් හෝ රඳවා ගත් අවස්ථාවක ගෙවන පාර්ශ්වය, එවැනි කිසිදු ගෙවීමක් දල එකතුවට එක් නොකළ යුතු අතර, අදාල අඩුකරගත් හෝ රඳවාගත් බදු හැර ශුද්ධ ගෙවීම් පමණක් ලබන පාර්ශ්වය වෙත සිදුකල යුතුය.

6. <u>ආදේශක සුරැකුම්පත්</u>

i. ඕනෑම ප්‍රතිගැනුම් ගණුදෙනුවකට අදාලව, මිල දී ගැනීමේ දිනයේ සිට ප්‍රතිගැනුම් දිනය දක්වා ඕනෑම අවස්ථාවක ඕනෑම අදාල තහවුරු කිරීමකට අනුව තැරැව්කරුට ඕනෑම මිලදීගත් සුරැකුම්පත් සඳහා වෙනත් සුදුසුකම්ලත් සුරැකුම්පත් ආදේශ කල හැක.කෙසේ වෙතත් එවැනි ආදේශිත සුරැකුම්පත්වල වෙළඳපොල වටිනාකම එලෙස මුලින්ම ආදේශ කරන ලද දිනයේදී, මිල දී ගත් සුරැකුම්පත්වල වෙළඳපොල වටිනාකමට අවම වශයෙන් සමාන විය යුතුය. එවැනි ආදේශ කිරීමක්, මිලදීගත් සුරැකුම්පත්වලට සමාන ආදේශන සුරැකුම්පත් ගණුදෙනුකරු වෙත හුවමාරු කිරීමෙන් සහ පළමුව මිලදීගත් සුරැකුම්පත් තැරැව්කරු වෙත හුවමාරු කිරීමෙන් සිදු කෙරේ. ආදේශ කිරීමෙන් පසු ආදේශිත සුරැකුම්පත්, මිලදීගත් සුරැකුම්පත් ලෙස සැලකෙන අතර, මුලින් මිලදීගත් සුරැකුම්පත් ඒ ආකාරයෙන් හැඳින්විය නොහැක. ඒ අනුව තැරැව්කරුට ගණුදෙනුකරුගේ සී.ඩී.එස්.ගිණුම වෙත බැර කිරීමට හෝ එමඟින් මාරු කරගැනීමට හෝ ගණුදෙනුකරුගේ සී.ඩී.එස්.ගිණුම වෙත මාරු කිරීම හැකිවේ.

ii. ප්‍රතිවිකුණුම් ගණුදෙනුවකට ඉහත (i) හි සඳහන් ආදේශන විධිවිධාන අදාල වන්නේ, එවැනි ආදේශ කිරීමක් සඳහා අදාල තහවුරු කිරීම සලසා ඇති විට පමණි.

7. පැහැර හැරීම / අවසන් කිරීමේ අවස්ථාව

i. පහත දැක්වෙන අවස්ථාවන් මෙම ගිවිසුම යටතේ පැහැර හැරීමේ අවස්ථාවන් ලෙස සැලකේ.

a) කවර පාර්ශ්වය හෝ මේ යටතේ ඕනෑම ගෙවීමක් සිදු කිරීමට හෝ වගකීමක් ඉටු කිරීමට අපොහොසත් වූ විට,
b) කවර පාර්ශ්වය හෝ මේ යටතේ සාවද්‍ය හෝ නොමඟ යවන සුළු ඉදිරිපත් කිරීමක් සිදුකල විට,
c) පාර්ශ්වයකට අදාලව බුන්වත්කම් පණත ක්‍රියාත්මක වන විට,
d) ගණුදෙනුකරු තනි පුද්ගලයෙකු නම්, එම පුද්ගලයා මියයාම, දුර්වල මනසකින් යුක්තවීම හෝ වෙනත් ආකාරයකින් ව්‍යාකූලත්වයට පත්වීම සහ මරණයකදී තැරැව්කරු වෙත ගණුදෙනුකරුගේ වගකීම්, මියගිය දිනයේ සිට දින 30 ක් ඇතුළත තෘප්තිමත් නොවීම.

ii. පැහැර හැරීම සිදුවන පාර්ශ්වය දැන සිටින එවැනි පැහැර හැරීමේ තත්වයක් පැහැර හැරීම සිදු නොකරන පාර්ශ්වය වෙත දැනුම් දීමට කටයුතු කල යුතුය.

iii. පැහැර හැරීමේ යම් සිදුවීමකදී , පැහැර හැරීම සිදු නොකළ පාර්ශ්වය විසින් පැහැර හරින ලද පාර්ශ්වය වෙත දින 03 කට නොඅඩු කාලයක් ලබා දී අවසන් කිරීමේ නිවේදනයක් නිකුත් කල හැක.

iv. පැහැර හැරීම සිදු නොකළ පාර්ශ්වය විසින් අවසන් කිරීමේ නිවේදනයක් ලබාදුන් පසු, මේ යටතේ සියළු ගණුදෙනුවල ප්‍රතිගැනුම් දිනය කඩිනම් කිරීමේ දිනය (Acceleration Date) දක්වා ඉදිරියට ගෙන එනු ලැබේ. (මෙහි නියමයන්ට අනුව එම දිනය, අවසන් කිරීමේ නිවේදනය ලැබෙනු ඇතැයි අපේක්ෂිත දිනයට පෙර දිනයක් නොවිය යුතුය) සෑම ගණුදනුවකටම අදාලව ප්‍රතිගැනුම් මිල ඒ අනුව සංශෝධනය විය යුතු අතර, එම ප්‍රමාණය, අදාල ප්‍රතිගැනුම් දිනය සහ කඩිනම් කිරීමේ දිනය සැලකිල්ලට ගෙන තැරැව්කරු විසින් සද්භාවයෙන් සිදු කල යුතුය. (එලෙස සංශෝධනය කරන ලද ප්‍රතිගැනුම් මිල සංශෝධිත ප්‍රතිගැනුම් මිල වේ.)

v. කඩිනම් කිරීමේ දිනය එළඹුණු විට,

A. තැරැව්කරු විසින් (a) මේ යටතේ මිල දී ගත් එක් එක් සුරැකුම්පත්වල වෙළඳපොල අගය සහ (b) මේ යටතේ සංශෝධිත ප්‍රතිගැනුම් මිල තීරණය කරන අතර,

B. ගණුදෙනුවට අදාල පාර්ශ්වයන්හි වගකීම් ස්වයංක්‍රියව ප්‍රතිස්ථාපනය වේ.

i. එහිදි, (a) සියළු ප්‍රතිගැනුම් ගණුදෙනුවල වෙළඳපොල අගයෙහි එකතුව සහ (b) සියළු ප්‍රතිවිකුණුම් ගණුදෙනුවල සංශෝධිත ප්‍රතිගැනුම් මිලෙහි එකතුව (එම මුදල වන තැරැව්කරුගේ ප්‍රමාණය) (c) සියළු ප්‍රතිවිකුනුම් ගණුදෙනුවල වෙළඳපොල අගයෙහි එකතුව සහ (d) ඕනෑම ප්‍රතිගැනුම් ගණුදෙනුවකට අදාල සංශෝධිත ප්‍රතිගැනුම් මිලෙහි එකතුව (එම මුදල වන ගණුදෙනුකරුගේ ප්‍රමාණය) ඉක්මවන විට, ගණුදෙනුකරුගේ වගකීමක් ලෙස (මෙහි 7(vi) වගන්තියට අදාලව) එම අතිරික්තයට සමාන මුදලක්, අත්හිටුවීමේ ගෙවීම් දිනයේදී තැරැව්කරු වෙත ගෙවිය යුතු අතර,

ii. ගණුදෙනුකරුගේ ප්‍රමාණය (මෙහි 7(v) (B)(1) හී දක්වා ඇති පරිදි) තැරැව්කරුගේ ප්‍රමාණය (මෙහි 7(v) (B)(1) හී දක්වා ඇති) ඉක්මවන විට තැරැව්කරුගේ වගකීමක් ලෙස (මෙහි 7(vi) මඟින් දක්වා ඇති පරිදි) එවැනි අතිරික්තයකට සමාන මුදලක්, අත්හිටුවීමේ ගෙවීම් දිනයේදි ගණුදෙනුකරු වෙත ගෙවිය යුතුය.

vi. ගිණුම් ඒකාබද්ධ කිරීම, ආදායම හිමි පාර්ශ්වය තීරණය කිරීම හෝ හිලව් කිරීම වැනි තැරැව්කරුට පවතින වෙනත් විකල්ප අයිතිවාසිකම් සීමාකිරීමකින් තොරව, (a) මෙහි 7(v) (B)(2) යටතේ ගණුදෙනුකරු වෙත ගෙවිය යුතු හෝ (b) මෙහි 7(v) (B)(2) යටතේ ගණුදෙනුකරු වෙත ගෙවිය යුතු මෙම ගිවිසුම හෝ වෙනත් ආකාරයකින් පැනනැගෙන ඕනෑම මුදලක් තැරැව්කරු විසින් හිලව් කල හැක.

8. දැන්වීම්

ගණුදෙනුකරු වෙත සිදුකරන දැන්වීම් මෙහි ඉහත දක්වා ඇති ගණුදෙනුකරුගේ ලිපිනයට හෝ ගණුදෙනුකරු විසින් තැරැව්කරු වෙත ලිඛිතව දන්වා ඇති ලිපිනයන්ට හෝ යොමුකල යුතු අතර, (i) පෞද්ගලිකව භාරදෙනු ලබන්නේ නම්, තැරැව්කරුගේ ("ව්‍යාපාරික වේලාව") තුල එම ව්‍යාපාරික දිනයේදී හෝ (භාරදෙන දිනය ව්‍යාපාරික දිනයක් නොවේ නම්, හෝ භාරදෙන වේලාව "ව්‍යාපාරික වේලාවෙන්" පිටත ඊළඟ ඉදිරි ව්‍යාපාරික දිනයේ ව්‍යාපාර කටයුතු ආරම්භයේ) විය යුතු අතර, (ii) ෆැක්ස් මාර්ගයෙන් යොමුකරන විට, අදාල සිහිකැඳවීම ලැබෙන දිනය ව්‍යාපාරික දිනයක හෝ (ව්‍යාපාරික දිනයක් නොවන දිනකදී) ෆැක්ස් පත යොමු කරන විට හෝ ලැබෙන වේලාව

“ව්‍යාපාරික වේලාවෙන්” පිටත නම්, ඊළඟ ඉදිරි දිනයේ ව්‍යාපාරික කටයුතු ආරම්භයේ) විය යුතු අතර, (iii) තැපැල් මාර්ගයෙන් යොමු කරන විට යැවූ දින සිට ව්‍යාපාරික දින 02 කට පසු දිනය දැන්වීම ගණුදෙනුකරු වෙත ලැබෙන දිනය සේ සැලකේ.

9. පමා වූ ගෙවීම් මත පොලිය

ගිවිසුම මත හෝ ඕනෑම ගණුදෙනුවකට අදාල යම් මුදලක් ගෙවීමට පාර්ශ්වයක් අපොහොසත් වුවහොත් පැහැර හැරීමේ අනුපාතය යටතේ පොලියක් ගෙවිය යුතු අතර, එය එම ගෙවීම නියමිත දිනයේ සිට අදාල පාර්ශ්වය වෙත ගෙවීම් ලැබෙන දිනය හැර ඒ දක්වා කාලය සඳහා පමණක් විය යුතුය. එවැනි පොලියක අනුපාතය, සැබෑ අනික්‍රාන්ත දින ගණනට සමානුපාතිකව දෛනික පදනමින් ගණනය කල යුතුය.

10. හුවමාරු කල නොහැකි බව

i. මෙම ගිවිසුම යටතේ කිසිදු පාර්ශ්වයක් විසින් සිය හිමිකම් සහ වගකීම් ,අනික් පාර්ශ්වයේ ලිඛිත අවසරයකින් තොරව, වෙනත් පාර්ශ්වයකට පැවරිය නොහැකි අතර, එවැනි තුන්වැනි පාර්ශ්වයක හිමිකම් නිර්මාණය කිරීමට කටයුතු නොකළ යුතුය.

ii. අදාල තහවුරු කිරීමක් මඟින්, විශේෂයෙන් සඳහන් කර ඇති විට හැර ප්‍රතිගැනුම් ගණුදෙනුවකදී, සුරකුම් පත්, මිලදීගත් දින සිට ප්‍රතිගැනුම් දිනය දක්වා කාලය තුල හුවමාරු නොකළ යුතුය.

11. තැරැව්කරුගේ වගකීම / බලාත්මක ඉල්ලීම (Force Majeure)

i. මේ යටතේ තැරැව්කරුගේ වගකීම් තැරැව්කරු විසින් පමණක් ක්‍රියාත්මක කල හැකි අතර, එවැනි ක්‍රියාකාරකම් ශ්‍රී ලංකාවේ බලපවත්වන නීති හා රෙගුලාසි වලට යටත් වේ.

ii. රාජ්‍යාධිකාර ක්‍රියාවක් හෝ බලාත්මක ඉල්ලීමකට හේතුවන තත්වයකදී තැරැව්කරු මේ යටතේ සිය වගකීම් ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වන විට හෝ ප්‍රායෝගික නොවන විට, එම වගකීම් ක්‍රියාත්මක කිරීම සඳහා තවදුරටත් බාධාවක් පැන නොනඟිනතෙක් හෝ එය ප්‍රායෝගික වන තුරු අදාල වගකීම් අත්හිටවනු ලබන අතර, එම අත්හිටුවීමේ කාලය තුල, එලෙස අත්හිටවූ වගකීම් සඳහා කිසිදු පොලියක් හෝ වෙනත් ගෙවීමක් (එවැනි අත්හිටුවීමක් ක්‍රියාත්මක නොවූ කාල සීමාව තුල වගකීම් වලට අදාලව ගෙවීමට නියමිතව තිබූ පොලියක් හෝ වෙනත් දීමනා හැර) සිදු නොකෙරෙන අතර අදාල වගකීම් පැහැර හැරීමේ හෝ අත්හිටුවීමේ තත්වයකදී

ක්‍රියාවට නංවන බව තැරැව්කරු ප්‍රකාශයට පත්කල හොත්, ශුද්ධ වටිනාකම් පිළිබඳ සමථයට පැමිණීමට හෝ හිලව් කිරීම සඳහා එම වගකීම් වල අගයන් ඇතුලත් කිරීමට අනෙකුත් පාර්ශ්වය තැරැව්කරුට ඉඩ සැලසිය යුතුය.

12. <u>පාලන නීතිය / අධිකරණ බල සීමාව</u>

මෙම ගිවිසුම සහ මේ යටතේ එළඹෙන සියළුම ගණුදෙනු, ශ්‍රී ලංකාවේ බලපවත්වන නීතිය යටතේ පාලනය වන අතර, පාර්ශ්වයන් ශ්‍රී ලංකාවේ අධිකරණයන්හි බලසීමාවට ඇතුලත් වේ.

මෙහි සාක්ෂි දරමින් පාර්ශ්වයන් විසින් ලියා අත්සන් කල මෙම ලේඛනයේ මුල් පිටුවෙහි දක්වා ඇති දින සිට බලපැවැත්වෙන පරිදි ,පහත දැක්වෙන අදාල දිනයන් බලාත්මක වෙයි.

බලයලත් අත්සන්කරුවෝ

එන් එස් බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ්

අත්සන් කලේ :	අත්සන් කලේ: ....
නම - ඩි.ඩි.එස්.සමරසිංහ	නම - එච්.එන්.ඕ.එම්.සෝමසිරි
තනතුර - කළමණාකරු	තනතුර - විධායක නිළධාරි
දිනය -	දිනය -

(ගණුදෙනුකරු තනි පුද්ගලයෙකු නම්)

අත්සන/අත්සන්-..	....
නම	නම..
සාක්ෂි	(නම)...
සාක්ෂි......................................	(නම)...

දිනය.......................................

(ගණුදෙනුකරු සංස්ථාපිත නම්)

.................................සමාගමේ පොදු මුද්‍රාව කොළඹ දී තබන ලද අතර පහත

අත්සන් කරන අධ්‍යක්ෂවරුන් .අධ්‍යක්ෂ ....සහ අධ්‍යක්ෂ ....ඉදිරියේ 20.....................................මස ....දින සහතික කරන ලදි.

අත්සන (1)..

අත්සන (2)..

සාක්ෂි

1. (නම)..

2. (නම)..

හෝ

අත්සන් කලේ...(සමාගමේ බලයලත් අත්සන්කරුවන් 20..මස............දින කොළඹදී)

1. (නම)..

2. (නම)..

සාක්ෂි

1. (නම)..

2. (නම)..

ඇමුණුම 1

<u>තැරැව්කරුගේ ලිපි ශීර්ෂය</u>

ණයදායකයා : { ගණුදෙනුකරුගේ නම }

ණය ගැනුම්කරු : { තැරැව්කරුගේ නම }

දිනය :

විෂය: ගණුදෙනු : (යොමු අංකය { })

හිතවත් මහත්මයාණනි,

මෙම ලිපියේ අරමුණ වන්නේ (අප අතර ප්‍රධාන ප්‍රතිගැනුම් ගණුදෙනුවේ / ගිවිසුමේ "තහවුරු කිරීම" ලෙස හඳුන්වනු ලබන) පහත සඳහන් ගිවිසුම් දිනයේදී අප අතර එළඹුණු ප්‍රතිගැනුම් ගණුදෙනුවේ නියමයන් හා කොන්දේසි සැකසීමයි.

මෙම තහවුරු කිරීම, ගිවිසුමට අතිරේකව එහි කොටසක් ලෙස ඊට අදාල වන අතර, විශේෂයෙන් පහත වෙනස් කර ඇති අවස්ථාවක හැර ගිවිසුමේ අන්තර්ගත සියළු විධිවිධාන මෙම තහවුරු කිරීම පාලනය කරනු ලබයි. ගිවිසුමේ අර්ථ නිරූපනය කර ඇති වචන හා වාක්‍යයන් සහ මෙම තහවුරු කිරීමේ යොදා ගෙන ඇති වචන හා වාක්‍ය සමාන අර්ථ දැරිය යුතුය.

මෙම තහවුරු කිරීම මඟින් සහතික කල ගණුදෙනුව මධ්‍යම තැන්පතු ක්‍රමයේ සටහන් කල යුතුය.

1. ගිවිසුම් දිනය :
2. ගණුදෙනුවේ ස්වභාවය : (ප්‍රතිගැනුම් ගණුදෙනුව) (ප්‍රතිවිකුණුම් ගණුදෙනුව)
3. මිල දී ගත් සුරැකුම්පත් :
   (තොරතුරු + ISIN අංක ඇතුළු)
4. මිල දී ගත් සුරැකුම්පත්වල වෙළඳපොල වටිනාකම :
5. මිල දී ගත් දිනය /බලපවත්වන දිනය :
6. මිල/පොලී අනුපාතය :
7. ප්‍රති ගැනුම් දිනය / කල්පිරීමේ දිනය :

8. ප්‍රති ගැනුම් මිල / පොලී අනුපාතය :

9. සුරැකුම්පත් ආදේශන වලංගු වේ (ඔව් / නැත)

10. සුරැකුම්පත් නැවත පිරවීම වලංගුය (ඔව් / නැත)

11. සුරැකුම්පත් ඉවත් කිරීම වලංගුය (ඔව් / නැත)

12. සුරැකුම්පත් හුවමාරු කිරීම වලංගුය (ඔව් / නැත)

13.අතිරේක කොන්දේසි

i. සුරැකුම්පත් වල වෙළඳපොල වටිනාකම තීරණය කිරීමට අවශ්‍ය වූ විට එය පාර්ශ්වයන් අතර පරස්පර ලෙස එකඟ වූ අනුපාතයක් මත සිදුවිය යුතු අතර, එසේ නොමැති විට, අදාල සුරැකුම්පත් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් ප්‍රකාශිත අනුපාතයන් මත විය යුතුය.

ii. කල්පිරීමේදී ලබන මුදල් / පොලී ආදායම් අයදුම් පත්‍රයෙහි සඳහන් කර ඇති ඔබේ මුදල් ගිණුමට හෝ අප වෙත නිසිලෙස දන්වා ඇති වෙනත් ඕනෑම ගිණුමකට බැර කරනු ලැබේ.

14. තහවුරු කිරීමේ දෝෂ : මෙම තහවුරු කිරීමේ කිසියම් දෝෂයක් වේ නම් එය ඔබ විසින් මෙම තහවුරු කිරීම ලැබී දින දෙකක් (02) ඇතුලත අපවෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

අපගේ ෆැක්ස් අංකය : අපගේ ටෙලෙක්ස් අංකය:

ලේඛන විමසීම් සඳහා අපගේ දුරකථන අංකය :

…………………………………….

වෙනුවට සහ වෙනුවෙන්

(තැරැව්කරුගේ නම)